# අධ්‍යාපන ක්‍රමයක් විසින් වැදගත් කොට සලකන අධ්‍යාපනික හා චර්යාමය අරමුණු සම්බන්ධයෙන් ද්විතීයික පාසලේ ළමුන්ගේ හා ගුරුවරුන්ගේ සම්ප්‍රජානනය පිළිබඳ අධ්‍යයනයක්.

අධ්‍යාපන දර්ශනපති උපාධිය


ටී.සී.සී. ජීවරත්න

බී.ඒ. (ලංකා)

අධ්‍යාපන ඩිප්ලෝමා (ලංකා)

අධ්‍යාපන පීඨය

කොළඹ විශ්වවිද්‍යාලය

කොළඹ 3.


1987-07-10.


UNIVERSITY OF COLOMBO SRI LANKA LIBRARY 20 JUN 1988

STOCK VERIFICATION

Class No. CR

Acc. No. 410168

UCLIB 410168

CR

## සංක්ෂේපයෙන්

අධ්‍යාපනය ක්‍රියාකාරී සමාජ දර්ශනයකි. සමාජය පවත්වාගෙන යාමට අවශ්‍ය ඉතාම වැදගත් දෙයද අධ්‍යාපනයයි. මෙම අධ්‍යාපන සාර්ථකත්වය ක්‍රියාත්මක වන්නේ ගුරුසිසු සහයෝගයෙනි. අධ්‍යාපනය යනු අපේක්ෂිත දිශාවන් කෙරේ ශිෂ්‍ය චර්යාවන් හෙවත් හැසිරීම් වෙනස් කිරීමේ ක්‍රියා පද්ධතියක් හැටියට සලකන නූතන යුගයේ අධ්‍යාපනික අරමුණු සම්බන්ධයෙන් ද්විතීයික පාසලේ ළමුන්ගේ හා ගුරුවරුන්ගේ සම්ප්‍රජානනය පිළිබඳ අධ්‍යයනයක් කිරීම මෙම පර්යේෂණයෙන් කෙරේ.

අධ්‍යාපන අරමුණු ප්‍රජානන, ආවේදනික, මනෝචාලක යන ක්ෂේත්‍ර 3 යටතේ ගුරුවරුන් හා සිසුන් හඳුනාගනු ලැබූ ආකාරය දකුව දෙනු ලබන වැදගත්කම පිළිබඳ තරා විශ්ලේෂණයක් කිරීමත් මෙම අධ්‍යයනයේ මූලික අරමුණු විය.

අධ්‍යාපන අරමුණු විනිශ්චය කර ගැනීම අධ්‍යාපන ක්‍රියාවලියක මූලික අවශ්‍යතාවයක් වුවද ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අරමුණු සම්බන්ධව යොමු වී ඇති අවධානය ප්‍රමාණවත් නොවේ. මෙකී අවශ්‍යතාවය අල්ප වශයෙන් හෝ පූර්ණය කිරීමේ අභිලාෂයෙන් මෙම පර්යේෂණය සකරිනි. මෙහිදී ද්විතීයික පාසල් ගුරු භවතුන්, විෂය මාලා තැනීමෙහි නිරත වූවන්, විශ්වවිද්‍යාල ගුරු විද්‍යාල කථිකාචාර්යවරුන්, ගුරු උපදේශක භවතුන් යන පිරිස් වලින් ලබාගත් අපේක්ෂණ ලැයිස්තු හා අදහස් ද , ලෝකයේ විවිධ රටවල ප්‍රකාශ කොට ඇති අධ්‍යාපන අරමුණු ද අලලමින් ප්‍රජානන, ආවේදනික, මනෝචාලක ක්ෂේත්‍රවලට අදාල වන පරිදි අරමුණු 15 බැගින් වූ ලැයිස්තු 3 ක් සකස් කර ගනු ලැබීන.

එම අරමුණු තුන පළමුවෙන් ගුරුභවතුන්ට දී වැදගත්කමේ අනුපිළිවෙල අනුව ප්‍රජානන ., ආවේදනික, මනෝචාලක යන ක්ෂේත්‍ර යටතේ තරා විශ්ලේෂණයක් කොට ඒවා සංජානනය කළ ආකාරය අනුව යුග්ම සැසඳුම් පිළිවෙත යොදාගෙන විවරණය කෙරිණි. දෙවනුව එම අරමුණු 15 බැගින්වූ ලයිස්තු තුන අඩංගු ලෙස තෝරාගත් ළමුන් 400 කටදී තමන්ට වඩා වැදගත් යැයි සිතෙන තමා හොඳින් හඳුනන අරමුණු හැටියට තෝරාගත් අරමුණු 10 බැගින් ලකුණු කිරිමට නියම කෙරිණි. අනතුරුව එසේ ලයිස්තු ගතකළ අරමුණු 10 බැගින්වූ ලයිස්තු තුන අඩංගු ලෙස තෝරාගත් ළමුන් 200කටදී තමන්ට වඩා වැදගත් යයි සිතෙන ආකාරයට ගුරුවරුන් සම්බන්ධයෙන් සංවිධානය කළ ආකාරයෙන්ම යුග්ම සැසඳුම් පිළිවෙත අනුව තරා කරණු ලැබිණි. එසේ තරා කිරිමේදී

I. ඉගෙනුම ලබන ශිෂ්‍යයින්ගේ ස්ත්‍රී පුරුෂ භාවය අරමුණු සම්ප්‍රජානනය කෙරේ බලපාන ආකාරයත්

II. ගුරුභවතුන්ගේ විවිධ සහතික මට්ටම් අනුව අරමුණු සම්ප්‍රජානනය කෙරෙන අන්දමේ වෙනසක් වේද යන්නත්

III. ආගමික වශයෙන් ශිෂ්‍යයින් අතර අධ්‍යාපනික අරමුණු සම්ප්‍රජානනය සම්බන්ධයෙන් කැපී පෙනෙන තරමේ විශාල වෙනසක් දක්නට ලැබේද යන්නත් සැලකිල්ලට ගනු ලැබිණ.

කාලීන අවශ්‍යතාවක් හැටියට ද්විතීයික පාසලේ අධ්‍යාපනය ලබන සිසුන් හා ඉගැන්විමෙහි නියුතු ගුරුවරුන් අධ්‍යාපන අරමුණු සම්බන්ධයෙන් දක්වන සම්ප්‍රජානනය පිළිබඳව අධ්‍යයනයක් කිරිම යෝග්‍ය යයි හැඟේ. ද්විතීයික පාසලේ ඉගෙනුම ලබන නව යෞවනයෝ රටේ අනාගත වගකීම් සම්භාරය උසුලන්නාහු වෙති. සංකීර්ණ ලෝකයක ජීවත්වීමට සූදානම්වන පුරවැසියෝ වෙති. ඔවුහු අනාගතය වෙනුවෙන්, රට වෙනුවෙන්, ජාතිය වෙනුවෙන් වැදගත් යම් දවසක ගත යුත්තෝය. යුතුකම් ඉටු කළ යුත්තෝය. ඔවුන් ක්‍රියාත්මක කරන බලවේග මත මුළු රටේම අනාගතය රඳා පවතිනු ඇත.

අද පාසලේ ඉගෙනුම ලබන ඔවුහු අනාගතයේ ඇතැම් විට පාලකයෝය. තවත් විටෙක රටේ දියුණුවට අතහිත දෙන විශේෂඥයෝය. තවත් අවස්ථාවක වැදගත් රාජ්‍ය තීරණ ගන්නා පුරවැසියෝය. වගකීම් පිරි ස්වාමි වරුය. භාර්‍යාවෝය. මව්වරුය. පියවරුය. මෙසේ විවිධ අවස්ථාවල විවිධ භූමිකා රඟපෑමට සිදුවන ඔවුනට පාසලේදී තමා ලබන අධ්‍යාපනයේ අරමුණු පිළිබඳ නිවැරදි හැඟීමත්, අවබෝධයත් තිබිය යුතුය. අනාගතය පිළිබඳ නිවැරදි තීරණ ගැනීමට සුදුසු මූලික පදනම පාසලින් දැමීමට නම් අධ්‍යාපන අරමුණු පිළිබඳ මනා වැටහීමක් ගුරුවරුන්ට මෙන්ම සිසුන්ටත් තිබිය යුතුමය. අනාගතයේදී තර්කානුකූලව සිතා බලා තීරණ ගැනීමට ඔවුන් හැඩගැස්විය යුත්තේ පාසල මගිනි. පාසල මෙම කර්තව්‍යයෙහිලා අපොහොසත් වුවහොත් ඉන් ඇතිවන අනර්ථකාරී ප්‍රතිඵල පුද්ගල සංවර්ධනය කෙරෙහි මෙන්ම පොදුවේ රට සංවර්ධනය කෙරෙහිත් බලපෑ හැකි බව කිව යුතුය. හැම අධ්‍යාපන ක්‍රමයක් මගින්ම ළඟාවීමට අපේක්ෂා කරන අරමුණු ඇත. මේ අරමුණු කොතෙක් දුරට අධ්‍යාපන ක්‍රමයක් මගින් ඉටුවේද යන්න සොයා බැලීම් වස් එම අරමුණු හැකිතාක් පැහැදිලිව හඳුනා ගැනීමට අත්‍යවශ්‍ය වේ.

පූර්ව පාසලට හෝ ප්‍රථම ශ්‍රේණියට පිවිසීමේ පටන් අධ්‍යාපන ජීවිතයේ අවසාන අදියර දක්වා ගුරුවරයා, විෂයමාලාව, හා පාසල් ක්‍රමය තුළින් කරන්නේ අපේක්ෂිත චර්යාවන් ශිෂ්‍යයා තුළ ඇති කිරීමේ සම්භාවිතාව වැඩි කිරීමයි. මෙසේ චර්යාමය වෙනස්කම් ඇති කිරීමට අවශ්‍ය වාතාවරණය සපයාලීම සඳහා අධ්‍යාපන අරමුණු මූලිකව හඳුනාගැනීම ගුරු සිසු දෙපිරිසටම වැදගත් වෙයි.

ප්‍රාථමික පාසලේ ළමුන්ට අධ්‍යාපන අරමුණු පිළිබඳව අවබෝධයක් තිබේද, ප්‍රාථමික පාසල් ගුරුවරුන්ට අධ්‍යාපන අරමුණු පිළිබඳ අවබෝධයක් තිබේද යන්න විමසා බැලීමට ප්‍රයත්නයක් දැරූ මෙම පර්යේෂණයෙන් ඇතිවන ප්‍රධාන වාසි කිහිපයක් ඇත. එනම් අධ්‍යාපනයේ ප්‍රජානන, ආවේදනික, මනෝචාලක යන ක්ෂෙත්‍රයන්හි අරමුණු වෙන් වෙන්ව වටහා ගැනීමෙන්

1. අධ්‍යාපන කාර්යයේ නිසිමග ප්‍රත්‍යක්ෂණය වීම.

11. අරමුණු ස්ථිරවම දන්නා නිසා පාසල් සංවිධානය පහසුවීම.

111. ගුරුවරයාගේ ඉගැන්වීම් කාර්යය පහසුවීම.

1V. ශිෂ්‍යයා, ගුරුවරයා, පාසල හා අධ්‍යාපන ක්‍රමය පිළිබඳ ඇගයීම් කා ර්යය පහසුවීම.

V. විෂයමාලා සකස් කිරීමේ කාර්යය පහසුවීම.

යන වාසිදායක ප්‍රතිඵල බලාපොරොත්තු විය හැ ක.

මෙහි පළමු පරිච්ඡේදය වෙන්වන්නේ අධ්‍යයනයේ අරමුණ හා ප්‍රායෝගික වැදගත්කම පැහැදිලි කරමින් එය ක්‍රියාත්මක කරන පිළිවෙල සැකෙවින් දැක්වීම සඳහාය.

දෙවන පරිච්ජේදයෙන් අධ්‍යාපන අරමුණු යනු මොනවාදැයි නිර්වචනය කිරීමත්, එහි ඉතිහාසය හා වර්ධනයත් විස්තර වෙයි.

තුන්වන පරිච්ජේදය තුළින් ඉදිරිපත් කරන්නේ ප්‍රාථමික පාසලේ ස්වභාවය හා එහි ළමුන්ගේ ස්වභාවයත්, ළමා අවශ්‍යතා හා අරමුණුවල සම්බන්ධතාවීත්ය.

හතරවන පරිච්ඡේදයෙන් ලංකාවේ අධ්‍යාපන අරමුණු පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කෙරේ.

අද්‍යතන අධ්‍යයනයෙහි පර්යේෂණ සැලසුම් පිළිවෙත පස්වන පරිච්ඡේදයෙන් විස්තර වෙයි.

හයවන හා හත්වන පරිච්ඡේදවලින් ලබාගත් දත්ත සංඛ්‍යානුකූල ක්‍රම මගින් විශ්ලේෂණය හා අර්ථකථනය කෙරෙන අතර ගුරුවරුන් හා ළමුන් අධ්‍යාපන අරමුණු හඳුනාගත් ආකාරය අනුව පැහැදිලි අරමුණු මාලාවක් ඉදිරිපත් කරමින් නිගමන ඉදිරිපත් කෙරේ.